tamilguru.lk

# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සාමාන්‍යාධිකාරී - තනතුරු 01

1. **සේවා ගණය** - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය - (HM 2-1)
2. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 1 හෝ 2)**

(අ) විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික(Basic) උපාධියක් ලබා තිබීම.

සමග

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / හෝ කළමනාකරණය පිළිබඳ වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

මූලික උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය අංශයේ ආයතනයක / රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර විස්සක (20) ක පළපුරුද්ද ලබා තිබීම. (අවම වශයෙන් මින් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික(Basic) උපාධියක් ලබා තිබීම.

සමග

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණයට අදාළ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය ආයතනයක/ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) ක විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (HM 1-1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05 (පහක) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

සමග

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීම මෙන්ම මානව සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාවන් තහවුරු කර තිබීම.

3. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 91,645 - 12 X 2,700 = 124,045/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.
4. **වයස** - වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
5. **බඳවා ගැනීමේ ක්‍රමවේදය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| 02. අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| 03. අනෙකුත් කාර්යය සාධනයන් සහ කුසලතා | - | ලකුණු 15 |
| 04. සම්මුඛ පරීක්ෂණයේදි කාර්යසාධනය | - | ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | - | **ලකුණු 100** |

සම්මුඛ පරීක්ෂණයේදි ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදුකෙරේ.

## 02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) - තනතුරු 01

1. **සේවා ගණය** - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය - (HM 1-1)
2. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 1 හෝ 2)**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව, කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම.

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ, පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි සංවර්ධන / කෘෂි ව්‍යාප්ති කටයුතු වලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

(2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි සංවර්ධන / කෘෂි ව්‍යාප්ති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවර්ධන / ව්‍යාප්ති කටයුතු පිළිබඳව කළමනාකාර MM 1-1 සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 80,295 - 15 X 2,270 = 114,345/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.
4. **වයස** - වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
5. **බඳවා ගැනීමේ ක්‍රමවේදය** - (අ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම
   (ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| 02. අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| 03. අනෙකුත් කාර්යය සාධනයන් සහ කුසලතා | - | ලකුණු 15 |
| 04. සම්මුඛ පරීක්ෂණයේදි කාර්යසාධනය | - | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | - | ලකුණු 100 |

සම්මුඛ පරීක්ෂණයේදි ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදුකෙරේ.

## 03. සහකාර කළමනාකරු (මානව සම්පත් / (පාලන) - තනතුරු 01

1. **සේවා ගණය** - කළමනාකාර සේවා ගණය (MM 1-1)
2. **ශ්‍රේණිය** - (MM 1-1 - II)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / හෝ ව්‍යාපාර පරිපාලනය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිපාලන / මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු එකක(01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම්.

හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරණ JM සේවා ගණයේ මානව සම්පත් සහ පරිපාලනයට අදාළ තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 04. සහකාර කළමනාකරු (සංවර්ධන) - තනතුරු 01

1. **සේවා ගණය** - කළමනාකාර සේවා ගණය (MM 1-1)
2. **ශ්‍රේණිය** - (MM 1-1 - II)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම විද්‍යාව / වැවිලි කළමනාකරණය / සමාජ විද්‍යාව / ව්‍යාපෘති කළමනාකරණය / ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වැවිලි / කෘෂි ක්ෂේත්‍රයේ ප්‍රජා / මානව සංවර්ධන කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම්.

හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ JM සේවා ගණයේ තනතුරක සමිති / ප්‍රජා සංවර්ධන / ක්ෂේත්‍ර සංවර්ධන ව්‍යාප්ති කටයුතු වලට අදාළ තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 05. සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) - තනතුරු 05

1. **සේවා ගණය** - කළමනාකාර - සේවා ගණය (MM 1-1)
2. **ශ්‍රේණිය** - (MM 1-1 - II)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම විද්‍යාව / ජීව විද්‍යාව / වැවිලි කළමනාකරණය / කළමනාකරණය / ආර්ථික විද්‍යාව / සංඛ්‍යානය පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂිකාර්මික සංවර්ධනය / සැලසුම්කරණය පිළිබඳව අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම්

හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරණ JM සේවා ගණයේ කෘෂි සංවර්ධන / ව්‍යාප්ති / සැලසුම්කරණය කටයුතු වලට අදාළ තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 06. සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) - තනතුරු 02

1. **සේවා ගණය** - කළමනාකාර සේවා ගණය (MM 1-1)
2. **ශ්‍රේණිය** - (MM 1-1 - II)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම විද්‍යාව හෝ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂිකාර්මික ව්‍යාප්තියට අදාළ කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරණ JM සේවා ගණයේ කෘෂි සංවර්ධන / ව්‍යාප්ති ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**ඉහත තනතුරු අංක 03 සිට අංක 06 දක්වා වැටුප් පරිමාණය**

මෙම තනතුරු වලට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 53,175 - 10 X 1,375 - 15 X 1,910 = 95,575/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු අංක 03 සිට අංක 06 දක්වා බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකරන අතර ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. අදාළ පළපුරුද්ද | - | ලකුණු 30 |
| 02. අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | - | ලකුණු 30 |
| 03. වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | - | ලකුණු 15 |
| 04. සම්මුඛ පරීක්ෂණයේදි දක්වන ලද කුසලතාවය | - | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | - | ලකුණු 100 |

සම්මුඛ පරීක්ෂණයේදි ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදුකෙරේ.

## 07. කාර්යභාර නිලධාරී / කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරී - තනතුරු 12

1. **සේවා ගණය** - කණිෂ්ඨ කළමනාකාර - සේවා ගණය (JM 1-1)
2. **ශ්‍රේණිය** - (JM 1-1 - II)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම විද්‍යාව හෝ වැවිලි කළමනාකරණයට අදාළ උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම්.

හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) MA 2-3 සේවා ගණයේ II වන ශ්‍රේණියේ වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත තනතුරු අංක 07 හි වැටුප් පරිමාණය**

මෙම තනතුර වලට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 42,600 - 10 X 755 - 18 X 1,135 - 70,580/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු අංක 07 හි බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරග විභාගය සඳහා වූ විෂය නිර්දේශය පහත දැක්වේ.**

- භාෂා ප්‍රවීණතාව
- අභියෝග්‍යතා පරීක්ෂණය
- තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම

**භාෂා ප්‍රවීණතාවය :**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සරල ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**අභියෝග්‍යතා පරීක්ෂණය :**

සිය නිල කාර්යයන් මැනවින් ඉටු කිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝග්‍යතාවය ද හැකියාව ද මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම :**

තනතුරට අදාළ වන පරිදි නියමිත විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

විභාගය සමත්වීම සඳහා අපේක්ෂකයකු එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු අතර ලකුණු මුළු එකතුව 50% ක් අවම වශයෙන් ලබාගත යුතුය.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීම**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| 2. අදාළ අතිරේක සුදුසුකම් | - | ලකුණු 30 |
| 3. වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | - | ලකුණු 15 |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | - | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | - | ලකුණු 100 |

- ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගැනීම සිදු කෙරේ.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගනු ලැබේ.

**ඉහත තනතුරු අංක 03 සිට අංක 07 දක්වා වයස**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

## 08. තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී - තනතුරු 07

1. **සේවා ගණය** - කළමනාකාරණ සහකාර - තාක්ෂණ (MA 2-3)
2. **ශ්‍රේණිය** - (MA 2-3 - III)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය හෝ වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ(05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

4. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 31,510 - 445 X 10 - 660 X 11 - 730 X 10 - 750 X 10 - 58,020/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

## 09. පොත් තබන්නා - තනතුරු 01

1. **සේවා ගණය** - කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2-2)
2. **ශ්‍රේණිය** - (MA 2-2 - III)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ගණකාධිකරණය හෝ පොත් තැබීම පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ(05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

4. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 රු. 30,310-10 X 300-7 X 350-4 X 600 - 20 X 710 - 52,360/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු අංක 08 සහ 09 දක්වා බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසුව ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරග විභාගයකින් හා පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරග විභාගය - තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී**

**ලිඛිත පරීක්ෂණය සඳහා වූ ක්‍රමවේදය**

**ප්‍රශ්න පත්‍ර දෙකකි.**

I පත්‍රය : කාලය පැය 01 කි.

tamilguru.lk

tamilguru.lk

බහුවරණ ප්‍රශ්න 50 ක් අඩංගුය.

විෂය නිර්දේශය : සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කෘෂිකාර්මික සිද්ධාන්ත, තේ තාක්ෂණය, තේ කර්මාන්තයට අදාළ කරුණු

ලකුණු : ප්‍රශ්න 50 X ලකුණු 2 බැගින් 100

II පත්‍රය : කාලය පැය 12 කි.

විෂය නිර්දේශය : කෘෂි කාර්මික මූලධර්ම, තේ අංශයට අදාළ කරුණු, තේ කර්මාන්තය හා තාක්ෂණය, කෘෂිකර්ම ව්‍යාප්තිය හා සන්නිවේදනය

**ප්‍රශ්න හා ලකුණු**

(i) කොටස

කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න

ඉන් 6 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.

ප්‍රශ්න 6 X ලකුණු 05 = ලකුණු 30

(ii) කොටස

රචනාත්මක ප්‍රශ්න 7 කි.

ඉන් 5 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.

ප්‍රශ්න 5 X ලකුණු 14 = ලකුණු 70

එකතුව = ලකුණු 100

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් ලකුණු 40% ක්ද ප්‍රශ්න පත්‍ර 2 සඳහා එකතුව අවම වශයෙන් 50% ක්ද ලබාගත යුතුය.

**ලිඛිත තරග විභාගය පොත් තබන්නා**

**ලිඛිත පරීක්ෂණය සඳහා වූ ක්‍රමවේදය**

**ප්‍රශ්න පත්‍ර දෙකකි.**

(i) පත්‍රය : කාලය පැය 1 1/2 (ලකුණු 100)

විෂය නිර්දේශය : සාමාන්‍ය දැනීම, තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික කරුණු, සාමාන්‍ය ගණිත ගැටලු

(ii) පත්‍රය : කාලය පැය 1 1/2 (ලකුණු 100)

විෂය නිර්දේශය : මූල්‍ය රෙගුලාසි, ගිණුම් තැබීම, කාර්යාල කළමනාකරණය (මූලික)

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් ලකුණු 40% ක්ද ප්‍රශ්න පත්‍ර 2 සඳහා එකතුව අවම වශයෙන් 50% ක්ද ලබාගත යුතුය.

**ඉහත තනතුරු අංක 08 සහ 09 දක්වා ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය**

| | | | |
|---|---|---|---|
| 01 | අදාළ පළපුරුද්ද | - | ලකුණු 30 |
| 02 | අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 30 |
| 03 | වෙනත් කුසලතා / කාර්යය සාධනය | - | ලකුණු 15 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | - | ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | - | 100 |

ලිඛිත තරග විභාගයෙන් හා ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

## 10. කළමනාකරණ සහකාර - තනතුරු 15

1. **සේවා ගණය** - කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන (MA 1-2)
2. **ශ්‍රේණිය** - (MA 1-2 - III)
3. **සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

අධ්‍යාපන

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06 කින් සමත්වීම. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබිය යුතුය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත (ආ), (ඇ), සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06 කින් සමත්වීම. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබිය යුතුය.

(ඇ) සේවයේ ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

3. **වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව 27,910- 10 X 300-7 X 350 - 12 X 600 - 12 X 710 = 49,080/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරග විභාගය**

**විවෘත තරග විභාගය (III ශ්‍රේණියට බඳවා ගැනීම - කළමනාකරණ සහකාර - (තාක්ෂණික නොවන බාහිර අයදුම්කරුවන් සඳහා)**

විෂය නිර්දේශය හා ලකුණු ලබා දීමේ ක්‍රමය පහත සඳහන් වේ.

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(1) **වන ප්‍රශ්න පත්‍රය** : (කාලය පැය 02)

**විෂය නිර්දේශය** : සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කාලීන, කෘෂිකාර්මික, සමාජ හා ආර්ථික තොරතුරු පිළිබඳ දැනුම සිද්ධි අධ්‍යයනය, මූලික කළමනාකරණ තොරතුරු

කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 08 කි.

සියල්ලටම පිළිතුරු අපේක්ෂිතය.

ලකුණු 8X5 ලකුණු 40

රචනාත්මක ප්‍රශ්න 07 කි.

ප්‍රශ්න 05 කට පිළිතුරු අපේක්ෂිතය.

ලකුණු 5X12 ලකුණු 60

මුළු ලකුණු ලකුණු 100

(2) **වන ප්‍රශ්න පත්‍රය** : (කාලය පැය 1 1/2)

**විෂය නිර්දේශය** : සිංහල භාෂාව/දෙමළ භාෂාව, භාෂා දැනුම, අත් අකුරු, අදහස් ප්‍රකාශ කිරීමේ විලාසය සරල ව්‍යාකරණ දැනුම, ගණිත ගැටලු, පරිගණක දැනුම

ප්‍රශ්න 6 කි. 5 කට පිළිතුරු අපේක්ෂිතයි.

ලකුණු 20× 5 ලකුණු 100

මෙම විභාගය සමත්වීම සඳහා අපේක්ෂකයන් විසින් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක්ද ප්‍රශ්න පත්‍ර දෙක සඳහා එකතුව අවම වශයෙන් ලකුණු 50% ක්ද ලබා ගත යුතුය.

**සීමිත තරග විභාගය. (III ශ්‍රේණියට බඳවා ගැනීම - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා)**

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | විෂයය | කාලය | ලකුණු |
|---|---|---|---|
| | | පැය 03 | |
| I | ප්‍රශ්න පත්‍රය<br>අධිකාරියේ කාර්යයන් කුඩා තේ වතු අංශයට අදාළ මූලික තොරතුරු, සාමාන්‍ය දැනීම, කෙටි පිළිතුරු සඳහා වූ ප්‍රශ්න අටකි. ඉන් පහ (05) කට පිළිතුරු අපේක්ෂිතය. | | ලකුණු 8X 5 ලකුණු 40 |
| II | ප්‍රශ්න පත්‍රය<br>සාමාන්‍ය ගණිත ගැටලු, සිංහල භාෂාව / දෙමළ භාෂාව, සරල ව්‍යාකරණ හා අදහස් ප්‍රකාශ කිරීමේ විලාසය ප්‍රශ්න 05 කි. ඉන් හතර (04) කට පිළිතුරු සැපයිය යුතුය. | | ලකුණු 15 X 4 ලකුණු 60 |
| | | මුළු ලකුණු | ලකුණු 100 |

මෙම විභාගය සමත්වීම සඳහා අපේක්ෂකයන් විසින් අවම වශයෙන් ලකුණු 50% ක්ද ලබා ගත යුතුය.

**සම්මුඛ පරීක්ෂණය**

| | | | |
|---|---|---|---|
| 01 | අදාළ පළපුරුද්ද | - | ලකුණු 30 |
| 02 | අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 30 |
| 03 | අනෙකුත් කුසලතා / කාර්යය සාධනය | - | ලකුණු 15 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | - | ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | - | 100 |

ලිඛිත තරග විභාගයෙන් සහ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට හුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

**ඉහත තනතුරු අංක 08 සිට අංක 10 දක්වා වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

වෙනත් - සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

අමතර ප්‍රතිලාභ - නේවාසික හා බාහිර වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ / ඇයගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 10% කට නොඅඩු මුදල් ප්‍රදානය කරනු ලබන අතර අධිකාරිය විසින් 15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3% ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

අයදුම්පත් - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, පළපුරුද්ද දක්වෙන සහතික හා වෙනත් කුසලතා හා කාර්ය සාධනයන්හි සහතික යන සහතික වල පිටපත් සමඟ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්තවූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ / ඇයගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය**

2023 ඔක්තෝම්බර් මස 08 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත , බත්තරමුල්ල.**